සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**12 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)**
**General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)**

| | |
|---|---|
| **ශෛවනෙරි I, II**<br>சைவநெறி I, II<br>Saivanery I, II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ශෛවනෙරි I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** මෙලොවත් එලොවත් තමන්ට වඩා ඉහළ කිසිදු නායකයෙකු නැති නිසා 'පිල්ලෙයාර්'ට ලබා දී ඇති නාමය වන්නේ,
(1) ගණපති ය. (2) වික්නේස්වරර් ය. (3) විනායකර් ය. (4) වක්කිර තුණ්ඩර් ය.

**2.** 'තමිලාගමම්' යනුවෙන් විශේෂත්වයට පත්වූ ග්‍රන්ථය වන්නේ,
(1) තිරුක්කුරල් ය. (2) තිරුමන්දිරම් ය. (3) තේවාරම් ය. (4) තිරුවාසගම් ය.

**3.** වෛදීහ මාර්ගයේ ප්‍රස්තානතිරයංගල් අතුරෙන් එකක් වන්නේ,
(1) බගවත්ගීතා ය. (2) පුරාණම් ය. (3) ආගමම් ය. (4) වේද ය.

**4.** අන්‍ය ආගමික අය විසින් ශෛව ආගමට එරෙහිව කළ ප්‍රචාර හෙළා දැක, ආරුමුග නාවලර් විසින් රචිත ග්‍රන්ථය වන්නේ,
(1) යාල්ප්පාණ වෛබවමාලෛ ය. (2) යාල්ප්පාණ සමයනිලෛ ය.
(3) සෛව තුෂණ පරිහාරම් ය. (4) පාල පාඩම් ය.

**5.** ශෛව තිරුමුරෛගල් අතුරෙන් දොළොස්වැනි තිරුමුරෛ වන්නේ,
(1) තිරුත්තොණ්ඩර් පුරාණම් ය. (2) තිරුත්තොණ්ඩර් තොගෛ ය.
(3) තිරුත්තොණ්ඩර් තිරුවන්දාදි ය. (4) තිරුත්තොණ්ඩර් උලා ය.

**6.** ආත්මය දෙවියන්ට ළඟාවීම සඳහා කරුණාව දක්වන ගුරු වන්නේ,
(1) තීට්චා ගුරු ය. (2) ඥාන ගුරු ය.
(3) විත්තියා ගුරු ය. (4) සමය ගුරු ය.

**7.** ආත්මය විඳින සියලු ම ද්‍රව්‍ය බිහිවීමට ප්‍රධාන හේතුව වන්නේ,
(1) ආණවම් ය. (2) කන්මම් ය. (3) මායෛ ය. (4) පසු ය.

**8.** 'ධර්මය' යන සංස්කෘත වචනයේ මූලික අර්ථය වන්නේ,
(1) විඳ දරා ගැනීම ය. (2) ජය ගැනීම ය.
(3) වැඩීම ය. (4) විවේක ගැනීම ය.

**9.** මහෝත්සවවල තේරු උත්සවය (රථ උත්සවය) පිළිබිඹු කරන පංච ක්‍රිතියම් වන්නේ,
(1) මැවීම ය. (2) රැකබලා ගැනීම ය. (3) විනාස කිරීම ය. (4) නොපෙන්වීම ය.

**10.** 'තම්බිරාන් තෝළන්' යන දේව නාමය දරන සමය කුරවර් වන්නේ,
(1) සුන්දරමූර්ති නායනාර් ය. (2) අප්පර් ස්වාමිහල් ය.
(3) තිරුඥාන සම්බන්දර් ය. (4) මාණික්කවාසගර් ය.

[දෙවැනි පිටුව බලන්න.

**11.** පුත්තලම දිස්ත්‍රික්කයේ උඩප්පු ශ්‍රී පාර්තසාරදි පෙරුමාල් දේවාලය හා සම්බන්ධ ගැමි දෙවියා වන්නේ,
(1) කණ්ණහි අම්මන් ය. (2) තිරෞපදෛ අම්මන් ය.
(3) වෛරවර් ය. (4) නාග තම්බිරාන් ය.

**12.** තිරුප්පනන්දාල් යන දේවාලයේ ඇදවී තිබුණ ලිංගය කෙළින් කරන ලද්දේ,
(1) කච්චියප්ප සිවාචාරියාර් විසින් ය. (2) මෙයිප්පොරුල් නායනාර් විසින් ය.
(3) කුංගිලියක්කලය නායනාර් විසින් ය. (4) නම්බියාණ්ඩාර් නම්බි විසින් ය.

**13.** දිනපතා දොළොස් වතාවක් පූජා පැවැත්වෙන දේවාලය වන්නේ,
(1) නගුලේච්චරම් ය. (2) තිරුකෝණේච්චරම් ය.
(3) කොක්කට්ටිච්චෝලෛ තාන්තෝන්රීස්වරම් ය. (4) තිරුච්චෙන්දූර් ය.

**14.** පරන්සෝදි තපස්වරයාගෙන් තමාගේ ඥානය පිළිබඳ අධ්‍යාපනය ලබාගත් සන්දාන කුරවර් වන්නේ,
(1) මෙයිකණ්ඩදේවර් ය. (2) අරුණන්දි සිවාචාරියාර් ය.
(3) උමාපදි සිවාචාරියාර් ය. (4) මරෛඥාන සම්බන්දර් ය.

**15.** මූත්ත නායනාර් තිරුවිරට්ටෛට මණිමාලෛ යන ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
(1) සේන්දනාර් විසින් ය. (2) සේදිරායර් විසින් ය.
(3) කුමරකුරුපරර් විසින් ය. (4) කපිල දේවර් විසින් ය.

**16.** ශ්‍රී ලංකාවේ වෛකාසිප් පොන්ගල් උත්සවය විශිෂ්ට අයුරින් පැවැත්වෙන දේවාලය වන්නේ,
(1) මාතලේ ශ්‍රී මුත්තුමාරියම්මන් දේවාලය ය. (2) පුන්නෛච්චෝලෛ කාලියම්මන් දේවාලය ය.
(3) වට්රාප්පලෛ කණ්ණහියම්මන් දේවාලය ය. (4) පාණ්ඩිරුප්පු තිරෞපදෛයම්මන් දේවාලය ය.

**17.** "උම්මඩියේන් උම්මඩිහල් තාංගි වරුම් පෙරුවාල්වු වන්දු එයිදප් පෙට්රු ඉංගුට්රේන්" යනුවෙන් තිරුඥාන සම්බන්දර් දෙස බලා පැවසූ පුද්ගලයා වන්නේ,
(1) තිරුනාවුක්කරසර් ය. (2) මංගෛයර්ක්කරසියාර් ය.
(3) පාණ්ඩිය රජතුමා ය. (4) කුලච්චිරෛයාර් ය.

**18.** 'පෙරුංකදෛ උපවාසය' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) කේදාර ගෞරි උපවාසය ය. (2) කන්දසශ්ටි උපවාසය ය.
(3) වරලට්සුමි උපවාසය ය. (4) විනායගසශ්ටි උපවාසය ය.

**19.** දේවාල දොරකඩයේ පිහිටුවනු ලබන තොරණ හා සම්බන්ධ කලාව වන්නේ,
(1) සංගීත කලාව ය. (2) නර්තන කලාව ය.
(3) නාට්‍ය කලාව ය. (4) සැරසිලි කලාව ය.

**20.** පරිපක්කුවම් (ඉතා හොඳ ප්‍රස්ථාව) ලබා සිටි පතොක් පඳුරට (මුල්ලිච් චෙඩි) විමුක්තිය ලබා දෙන ලද්දේ,
(1) මරෛඥාන සම්බන්දර් විසින් ය. (2) උමාපදි සිවාචාරියාර් විසින් ය.
(3) අරුණන්දි සිවාචාරියාර් විසින් ය. (4) මෙයිකණ්ඩදේවර් විසින් ය.

**21.** "උණ්ඩි කොඩුත්තෝර් උයිර් කොඩුත්තෝරේ" (ආහාර දුන් තැනැත්තා ප්‍රාණය දුන් තැනැත්තා ය) යන ගී පදයේ ප්‍රකාශ වන ආචාරධර්ම ලක්ෂණය වන්නේ,
(1) ආගන්තුක සත්කාරය ය. (2) යහපත ය.
(3) දේව වන්දනා ය. (4) සත්‍යය ය.

**22.** 'පිරමන්තන් සිරම් ඇරින්ද පෙරියෝයි පොට්රි' යන ගී පදයේ අගය කරනු ලබන්නේ,
(1) ඉන්ද්‍රන් ය. (2) විෂ්ණු දෙවියන් ය.
(3) විනායගර් ය. (4) වෛරවර් ය.

**23.** කළු තල, තල තෙල් යනාදිය දන් දීම හා සම්බන්ධ උපවාසය වන්නේ,
(1) කන්දසශ්ටි. (2) පුරට්ටාති සනි.
(3) තිරුවාදිරෛ. (4) විනායගසශ්ටි.

**24.** අභ්‍යන්තර ආචාරධර්මවලින් එකක් වන්නේ,
(1) ශරීරය පිරිසිදුව තබා ගැනීම ය. (2) පිරිසිදු ආහාර අනුභව කිරීම ය.
(3) යහපත් අදහස් සමග ජීවත්වීම ය. (4) ක්‍රමානුකූලව පූජා කිරීම ය.

[තුන්වැනි පිටුව බලන්න.

371

**25.** අරුණන්දි සිවචාරියාර් විසින් රචනා කරන ලද ග්‍රන්ථ වන්නේ,
(1) සිවඥාන පෝදම් සහ සිවඥානසිත්තියාර් ය.
(2) සිවඥානසිත්තියාර් සහ ඉරුපා ඉරුපහ්දු ය.
(3) සිවඥාන පෝදම් සහ ඉරුපා ඉරුපහ්දු ය.
(4) සිවඥානසිත්තියාර් සහ තිරුවරුට්පයන් ය.

**26.** පදිගේ සොරුබලක්කණම් යනු,
(1) ගුණවන්තකමින් ඔබ්බට ගිය තත්වය වේ.
(2) තුන් වාර්ගික දේව ශරීර සහිත තත්වය වේ.
(3) ඥානාංග අටක් සහිත යහපත් තත්වය වේ.
(4) පංච ක්‍රියම් සිදුකරන තත්වය වේ.

**27.** වේදය 'අපෞර්ශේයම්' යනුවෙන් හැඳින්වීමට හේතුව වන්නේ,
(1) ශ්‍රවනමය වශයෙන් ආරක්ෂා කරගනිමින් සිටින නිසා ය.
(2) කොටස් හතරකින් යුක්ත නිසා ය.
(3) මිනිසා විසින් නොමැවීම නිසා ය.
(4) ඉපැරණි කාලයේ සිට ඉගෙන ගනිමින් සිටින නිසා ය.

**28.** පැරණි කාලයේ නිවෙස්වල ඉදිරිපස ගෙයි පිල පිහිටුවීමේ අරමුණ වන්නේ,
(1) තණකොළ සොයා යන සතුන්ට නැවතී සිට යාමට ය.
(2) මග යන අයට නැවතී කුසගින්න හා තෙහෙට්ටුව නැති කර ගැනීමට ය.
(3) සතුන්ට තම ශරීරය අතුලලා කිණිතුල්ලන් ආදිය ඉවත් කර ගැනීමට ය.
(4) නිවසේ සිටින අය අසුන්ගෙන අනවශ්‍ය දේවල් කතා කිරීමට ය.

**29.** බගවත්ගීතාව සහ ධම්මපදය දේශනා කරන සදාචාරධර්මවලට ඇතුළත් **නොවන්නේ,**
(1) මනුෂ්‍යයෝ ආශාවන්ට වැදගත්කමක් නොදිය යුතුය යන්න ය.
(2) මානව විමුක්තියට දහම වැදගත් ය යන්න ය.
(3) ප්‍රතිලාභ සලකා ක්‍රියාවන් කළ යුතුයි යන්න ය.
(4) ඔවුන්නොවුන් තම රාජකාරිය නිසියාකාරව සිදු කළ යුතුයි යන්න ය.

**30.** ආබ්ද වාක්‍ය ප්‍රමාණම් යනු,
(1) ඉන්ද්‍රියන් මගින් ලබා ගන්නා ඥානය වේ.
(2) ඍෂිවරුන් තම අත්දැකීමෙන් පැවසූ සත්‍ය දේවල් වේ.
(3) දන්නා සත්‍ය දේවල්වලින් අනුමාන කර දැනගන්නා දැනුම වේ.
(4) පංච භූතවලින් ලබාගන්නා දැනුම වේ.

**31.** සිවත්තියානම් යනු,
(1) දේවාලයේ අලංකාර බව මනසේ තබා ගෙන භාවනා කිරීම ය.
(2) මිනිසා තමා සහ තම ජීවිතය මනසේ තබා භාවනා කිරීම ය.
(3) දෙවියන්ගේ කරුණාව සහ අභිමානය මනසේ තබා භාවනා කිරීම ය.
(4) මළවුන් සහ ඔවුන්ගේ අභිමානය මනසේ තබා භාවනා කිරීම ය.

**32.** ශෛව සාරධර්මවලින් 'යහපතය' (ඔප්පුරවු) යනු,
(1) ජීවීන්ට ආදරය පෙන්වීම වේ.
(2) මිනිසෙකුට ආහාර යනාදිය ලබා දීම වේ.
(3) තිබෙන දේවල් එලෙස ම පවසන ධර්මය වේ.
(4) සමාජයේ අවශ්‍යතාවය දැනගෙන සිදුකරන සදාචාර ක්‍රියාවන් වේ.

**33.** මාර්හළි තිරුවාදිරෛ දිනයෙහි විශේෂ අභිෂේක වන්දනා සිදු කරන්නේ,
(1) සිවලිංග පෙරුමාන්ට ය. (2) තට්චිණා මූර්තියට ය.
(3) නඩරාජා පෙරුමාන්ට ය. (4) ලිංගෝට්ප මූර්තියට ය.

**34.** තිරුනීරු 'විභූදි' යනුවෙන් නම් දැරීමට හේතුව වන්නේ,
(1) ආලෝකය ලබා දෙන නිසා ය.
(2) තුන් වාර්ගික මළ නැති කිරීම නිසා ය.
(3) පව් පුළුස්සා දමා අළු කිරීම නිසා ය.
(4) වටිනා ධනය ලබා දෙන නිසා ය.

[හතරවැනි පිටුව බලන්න.

**35.** අපර කිරියෙවලින් 'අස්ති සප්ජයනම්' යනු,
(1) මළවුන්ගේ ඥාතීන් එක් වී ඔහුගේ ආත්ම සාමය වෙනුවෙන් යාඥා කිරීම වේ.
(2) මිය ගිය තැනැත්තාගේ මෘත දේහයේ අළු පූජනීය ජල මූලාශ්‍රවල දිය කිරීම වේ.
(3) කෙනෙක් මිය යාමෙන් පසුව සෑම මාසයක ම සිදුකරන පිළිවෙත් වේ.
(4) මියගිය තැනැත්තාට වාර්ෂිකව නිශ්චිත දිනයෙහි (තිදියෙහි) සිදුකරන දේවල් වේ.

**36.** පංච ක්‍රිතියම්වලින් නොපෙන්වීම යනු,
(1) ආත්මයන් මළ බැඳීම්වලින් සම්පූර්ණයෙන් ම ඉවත් කර ඔවුන් සඳහා මෝක්ෂය ලබා දීම වේ.
(2) මවන ලද දේවල් සිටිය යුතු කාලය දක්වා ම ඔවුන්ව රැක බලා ගැනීම වේ.
(3) ආත්මයන් අත්පත් කර තිබෙන මළවල ජවයට බාධා කිරීම වේ.
(4) ආත්මවලට තනු, කරණ සහ බුවන සැප නිර්මාණය කිරීම වේ.

**37.** පසු පුණ්ණියම් යනු,
(1) දෙවියාට සිදුකරන සේවාවන් වේ.
(2) දෙවියන්ගේ බැතිමතුන්ට සිදුකරන සේවාවන් වේ.
(3) දේවාලයට සිදුකරන සේවාවන් වේ.
(4) ජීවීන්ට සිදුකරන යහපත් සේවාවන් වේ.

- පහත සඳහන් වගුවේ A සිට I දක්වා දී ඇති තොරතුරු ආශ්‍රයෙන් **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| **දේවාලය** | **රුක්ෂය (තල විරුට්සම්)** | **විශේෂත්ව** |
|---|---|---|
| A – මාමාංග පිල්ලෙයාර් දේවාලය | D – වන්නි ගස | G – අවුරුද්දක මහෝත්සව දෙකක් පැවැත්වෙන දේවාලය |
| B – පොන්නාලෙ වරදරාජප් පෙරුමාල් දේවාලය | E – පාවට්ටා ගස | H – විනායගර් අංගි ආවරණය කරන ලද සිවලිංගම් ප්‍රධාන මූර්ති ලෙස පිහිට වූ දේවාලය |
| C – ඉණුවිල් කන්දසාමි දේවාලය | F – කුරුන්ද ගස | I – ප්‍රමාණයෙන් අතිවිශාල යහන ඇති දේවාලය |

**38.** විෂ්ණු දේවාලය හා සම්බන්ධ කාණ්ඩය වන්නේ,
(1) BDI (2) BDG (3) BEI (4) BFG

**39.** මුල්ලාලලිංගය හා සම්බන්ධ කාණ්ඩය වන්නේ,
(1) ADH (2) AEH (3) AFH (4) AFI

**40.** මුරුග දේවාලය හා සම්බන්ධ කාණ්ඩය වන්නේ,
(1) CDI (2) CDG (3) CEG (4) CEI

* *

iruonline.com

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**12 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

**ශෛවනෙරි I, II**
சைவநெறி I, II
Saivanery I, II

## ශෛවනෙරි II

※ **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
※ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු 10 බැගින් ද හිමි වේ.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) උපවාසය යනු කුමක් ද?

(ii) පූර්ව කිරියෛහල් **දෙකක්** සඳහන් කරන්න.

(iii) හින්දු භක්තිකයන්ගේ ජීවිතයේ පංචාංගම් භාවිත කරනු ලබන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(iv) සනිහලිංග ස්ථාපිත කිරීමට භාවිත කරනු ලබන ද්‍රව්‍ය **දෙකක්** සඳහන් කරන්න.

(v) වෛරවර්ට අයත් විශේෂ දින **දෙකක්** සඳහන් කරන්න.

(vi) වරද පණ්ඩිදර් විසින් රචනා කරන ලද පිල්ලෛයාර් කතන්දර පොත පරිශීලනයෙන් ලැබෙන ප්‍රයෝජන (නූට්පයන්) **දෙකක්** සඳහන් කරන්න.

(vii) කන්ද පුරාණය රචනා කළේ කවුරුන් ද? මෙම පුරාණයේ 'මීට්චිප් පඩලම්' අයත් වන්නේ කුමන කාණ්ඩයට ද?

(viii) ගීතිකාවලින් ගයනු ලැබූ ශ්‍රී ලංකාවේ පැරණි ඊශ්වර දේවාල **දෙකක** නම් සඳහන් කරන්න.

(ix) තිරුමුරෛහල් සම්පාදනය කළේ කවරෙකු විසින් ද? සම්පාදනය සඳහා මෙහෙයවනු ලැබුවේ කවරෙකු විසින් ද?

(x) කණ්ණහියම්මන් උදෙසා සිදු කරන චාරිත්‍රවලදී ගයනු ලබන ගීතවල, පසුබිමෙහි වාදනයට යොදා ගන්නා සංගීත උපකරණ **දෙකක්** සඳහන් කරන්න.

**2.** (i) පහත සඳහන් ගීතිකා අතුරෙන් තෝරා ගත් ගීතිකා **දෙකක්** නිවැරදිව හා නියමිත අනුපිළිවෙළට ලියන්න.

(අ) "මීලා අඩිමෛ උමක්කේ..."

(ආ) "කූනිත්ත පුරුවමුම් කොව්වෛච්.."

(ඉ) "උට්රුමෛ සේර්වදු මෙය්යිනෛයේ..."

(ඊ) "උම්බර්තරුත් තේනුමණික්..."

(උ) "තුක්කුම් පනුවල් තුරෛ..."

(ii) ඉහත (i) හි ලියන ලද ගීතිකාවල අදහස සරලව ලියන්න.

**3.** "යාන් උනෛත් තොඩර්න්දු සික්කෙනප් පිඩිත්තේන්
එංගු එළුන්දරුළුවදු ඉනියේ"

– තිරුවාදවූරර් –

(i) තිරුවාදවූරර්ට මාණික්කවාසහර් යන නම ලැබීමට හේතුව කුමක් ද?

(ii) තිරුවාදවූරර් විසින් සිදුකළ හාස්කම් **තුනක්** සඳහන් කරන්න.

(iii) තිරුවාදවූරර් විසින් 'තිරුච්චිට්රම්බලක් කෝවෛයාර්' ගායනා කළ අවස්ථාව කෙටියෙන් පහදන්න.

[හයවැනි පිටුව බලන්න.

4. "නායහනාර් මූන්නම් උරෛරත්ත ආගමනූල්"

– පෙරිය පුරාණම් –

(i) ආගමම් යන්නෙහි අර්ථය කුමක් ද?
(ii) ශෛවම්, වෛණවම්, සාක්තම් යනාදී මාර්ගවලට අදාළ ආගමම්වල විශේෂ නම් සඳහන් කරන්න.
(iii) සිවාහමංගල් පවසන මාර්ග හතර (පාදංගල්) කෙටියෙන් පහදන්න.

5. "සත්තසත්තෙච් චාරා තසත්තරියා තංගණිවෛ
යුට්ර සද සත්තා මුයිර්"

– තිරුවරුට්පයන් –

(i) ආත්මවලට කියනු ලබන වෙනත් නම් **දෙකක්** ලියන්න.
(ii) ආත්ම 'සදසත්තු' යනුවෙන් හැඳින්වීමට හේතුව සඳහන් කරන්න.
(iii) තුන් වාර්ගික ආත්ම පිළිබඳව කෙටියෙන් පහදන්න.

6. "අන්බෝඩු ඉයෛන්ද වළක්කෙන්බ ආරුයිර්ක්කු
එන්බෝඩු ඉයෛන්ද තොඩර්බු"

– තිරුවල්ලුවර් –

(i) හින්දු භක්තිකයන් විසින් සමරනු ලබන උත්සව **දෙකක්** නම් කරන්න.
(ii) උත්සව සැමරීමෙන් ඇතිවන වාසි **තුනක්** සඳහන් කරන්න.
(iii) දීපවාලි උත්සවය මගින් ඉගැන්වන දර්ශනය කෙටියෙන් පහදන්න.

7. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(i) ස්වාමි විපුලානන්දර්ගේ ආගමික සේවා
(ii) ශෛව විත්‍යා විරුත්ති සංගම්
(iii) නයිනෛ නාගපූසණි අම්මන් දේවාලය
(iv) ශෛව සාරධර්මයක් ලෙස ආදරය

✻✻✻

iruonline.com